තොචිගි නගර ශාලාව මගින් සිදුකරන දැනුම් දීමයි

# [වැදගත්] නියම කරන ලද කසල බෑග් සඳහා විකල්ප පියවර පිළිබඳව

නගරවාසී සියලු දෙනාටම මෙමගින් ඇති වී ඇති අපහසුතාවයක් සඳහා අපි සමාව අයදින්නෙමු, තවද අවශ්‍ය ප්‍රමාණයට වඩා නම් කරන ලද කසළ බෑග් මිලදී ගැනීමෙන් වළකින ලෙසත්, දැනට පහත සඳහන් ක්‍රම භාවිතා කර ඔබේ කසළ බැහැර කරන ලෙසත් අපි ඉල්ලා සිටිමු.

තවද, මෙය ස්ථාවර සැපයුමක් සුරක්ෂිත වන තෙක් පමණක් සිදුකරන තාවකාලික පියවරක් වේ.එබැවින් නිසි ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ඔබගේ අවබෝධය සහ සහයෝගය අපි ඉල්ලා සිටිමු.

## ≪ඔබට නම් කරන ලද කසල බෑග් මිලදී ගත නොහැකි අවස්ථාවක ක්‍රියා කලයුතු ආකාරය ≫

<u>ඔබට නම් කරන ලද කසළ බෑග් මිලදී ගැනීමට නොහැකි නම්, කරුණාකර ඔබේ නිවසේ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා විනිවිද පෙනෙන හෝ ඇතුලත පෙනෙන අර්ධ විනිවිද පෙනෙන බෑග් භාවිතා කරන්න.</u>

**[බෑගයේ වර්ණය] විනිවිද පෙනෙන හෝ ඇතුලත පෙනෙන අර්ධ විනිවිද පෙනෙන බෑග් විය යුතුය.(විවිධ වර්ණ ගැන්වූ බෑග් සඳහා අවසර නැත)**

※ප්ලාස්ටික් බෝතල්, ආහාර සකසා ඇති තැටි සහ හිස් කෑන්/ හිස් බෝතල් වෙනුවෙන් නම් කර ඇති බෑග් සාමාන්‍ය දහනය කළ හැකි කසල සඳහා ද භාවිතා කළ හැකිය.

**[බෑගයේ ප්‍රමාණයන්]**

**○ දහනය කළ හැකි අපද්‍රව්‍ය(මොයසු ගොමි ), ප්ලාස්ටික් බෝතල් සහ ආහාර තැටි සඳහා ලීටර් 45 දක්වා.**

**○ හිස් කෑන් සහ හිස් බෝතල් සඳහා ලීටර් 30 දක්වා.**

[සටහන් කිරීමට අවශ්‍ය තොරතුරු] කරුණාකර පහත තොරතුරු ①②③ බෑගයේ විශාලව ලියන්න. ① අසල්වැසි සංගමයේ හෝ නගරයේ නම ② වාසගම සහිත නම

③ අපද්‍රව්‍ය වර්ගය (දැවිය හැකි අපද්‍රව්‍ය, ප්ලාස්ටික් බෝතල්/ආහාර ආදිය ගෙනෙන එන හිස් තැටි, හිස් කෑන්/හිස් විදුරු බෝතල්)

[කාලසීමාව] 2026 අප්‍රේල් 28 වන දින (අඟහරුවාදා) සිට
නම් කරන ලද කසල බෑග් සැපයුම ස්ථාවර වන තුරු

| විනිවිද පෙනෙන හෝ ඇතුලත පෙනෙන අර්ධ විනිවිද පෙනෙන බෑගය ⇒රැගෙන යන්නෙමු. (කුණුඑකතු කරන්නෙමු ) | ඇතුලත නොපෙනෙන බෑග් ⇒රැගෙන නොයනු ලැබේ. (කුණු එකතු නොකරන්නෙමු) |
| --- | --- |
|  |  |

(සම්බන්ධතා සඳහා)

තොචිගි නගර ජීවන පරිසර දෙපාර්තමේන්තුව, පිරිසිදුකම ප්‍රවර්ධන හා අපද්‍රව්‍ය අවම කිරීමේ අංශය
දුරකථන: 0282-31-2447